# Living the Lotus 2

## *Buddhism in Everyday Life*

2025
VOL. 233




## The Inauguration Ceremony for Rissho Kosei-kai of San Antonio
## A New Beginning with Gratitude and Resolve


Living the Lotus
Vol. 233 (February 2025)

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga
published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp



රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

# අනාගතය ගොඩනගමු

නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## 'රළු ලෝකයක්' නිර්මාණය කරන්නේ කවුරුන්ද......

ධර්ම පණිවුඩය ආරම්භයේදීම, ඔබ සියලු දෙනාගෙන් එක් දෙයක් විමසමි.

දැන් ඔබ ඉදිරියේ දොඩම් ගෙඩි තුනක් තිබේ නම්, එය දෙදෙනකු අතර බෙදන්නේ කෙසේද? එය මම කියවූ ග්‍රන්ථයක තිබූ කරුණකි. එක් ගුරුවරයෙක් සිසුන් දෙදෙනෙකුට දොඩම් ගෙඩි 3ක් ලබා දී ඒවා දෙදෙනා අතර බෙදන්නේ කෙසේදැයි විමසීය. එහිදී, එක් සිසුවෙක් 'එක් දොඩම් ගෙඩියක් බුදුරදුන්ට පූජා කර, ඉතිරි දොඩම් වලින් එක් දොඩම් ගෙඩිය බැගින් දෙදෙනා  බෙද ගන්නවා' ලෙස පැවසීය. එවිට ගුරුවරයා එය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කර, 'මොනවද ඔබ කියන්නේ. එක හමාර බැගින් දෙදෙනා  බෙද ගන්නවා' ලෙස පැවසීය.

ගණිත ගැටලු සම්බන්ධයෙන් ගත් විට නිසැකවම මෙය සත්‍යයක් වුවද, ළමා සාහිත්‍ය කතුවරයෙකු වන දයිගකු හනඔකා මහතා ළමා සංස්කෘතික පර්යේෂකයෙකු වන තසුකු යොශිඔකා මහතා සමඟ කල සාකච්ඡාවකදී, මෙම කතාව පිළිබඳව පවසමින් මුල් ළමාවිය අධ්‍යාපනය සහ ආගමික හැඟීම්වල වැදගත්කම සමඟ මිනිස් දැනුමෙන් ඔබ්බට ගිය ජීවී හෝ අජීවී සෑම දෙයකටම ගෞරව කිරීමේ හැඟීමක් අපට නොමැතිකම තෙතමනයක් සහ යහපත් මානසිකත්වයක් නොමැති රළු ලෝකයක් නිර්මාණය වීමට හේතු වී ඇතැයි පවසා ඇත.

මෑත කාලයේ පාසල් දිවා ආහාරය ගන්නා විට 'මගේ දරුවාට 'ඉතදකිමස් (ආහාරයට ස්තූතියි)' කියලා කියවන්න එපා' ලෙස පවසන මව්වරුන් ඉන්නා බව, ජාන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රසිද්ධ විශේෂඥයෙක් වන කසුඔ මුරකමි මහතාගේ ග්‍රන්ථයක සඳහන්ව ඇත. එයට හේතුව ඔවුන් පාසල් දිවා ආහාරය සඳහා ගාස්තුවක් ගෙවන බැවිනි.

නමුත්, සියලු දෙනාම දන්නා පරිදි 'ඉතදකිමස්' යනු තම ජීවිතය වෙනුවෙන් අන් අයගේ ජීවිත ලබා ගැනීම සිහිපත් කර, අප ආහාර ගන්නා සෑම අවස්ථාවකම කෘතඥතාවය පල කරන වාක්‍ය ඛණ්ඩයකි. මෙය සියලු ජීවීන් පෝෂණය කරන ස්වභාවධර්ම මාතාව, දෙවිවරුන් සහ බුදුවරුන් සහ ඊට අමතරව අපගේ කෑම මේසයට ආහාරය ගෙන ඒමට දායක වන බොහෝ පුද්ගලයන්ට කෘත ඥතාවය පළ කරන 'ගෞරවණීය හදවතේ' අරෝපණ කියමනකි. එය අමතක කර, උපයෝගිතාවය සහ තාර්කිකත්වය පමණක් දකින දෙමාපියන්ගේ සහ වැඩිහිටියන්ගේ මනස සහ ආකල්ප මඟින් ඊළඟ පරම්පරාවට නායකත්වය ලබා දෙන පුද්ගලයන්ට ඇති කරන විශාල බලපෑම පිළිබඳව කණගාටු වන්නේ මා පමණක් නොවන බව විශ්වාසයි.

## අනාගතය ගොඩනැගෙන්නේ 'මේ මොහොතේ, මෙතැන' සිටයි

මම මෙලෙස සිතමි. ජපානයේ බොහෝ පුද්ගලයන් අලුත් අවුරුදු සමයේ දේවාල සහ පන්සල් වලට වන්දනා කිරීමට යනවා සේම, ඔහිගන් හා ඔබොන් නම් මියගිය ඥාතීන් සිහිපත් කරණ කාල වකවානු වල්දී, සොහොන් බිම් වලට ගොස් වන්දනා කිරීමට හා එම ආත්ම  පිළිගනිමින් වන්දනා කරති. තවද, ජපානයේ ෂින්ටෝ දහම සහ බුදු දහම මත කේන්ද්‍රගතව කොන්ෆියුසියස් වාදයද ව්‍යාප්ත වී, බටහිර සිරිත් විරිත් අනුගමනය කර ඇත. එමඟින් අපගේ හැඟීම් පොහොසත් කරන ඉගැන්වීම් බොහෝමයක් ලබාගෙන ඒවා අධ්‍යයනය කර, ඒවා සමපාත කරමින් ඉතිහාසය කැටයම් කර තිබේ.

සත්‍ය ලෙසටම ජපානයේ පමණක් නොව, සෑම රටකම පූජනීය දේවල්වලට ගෞරව නමස්කාර කරන ආගමික සංස්කෘතීන් පවතී. වෙනත් ලෙසකින් කිවහොත් සියලුම පුද්ගලයන් ගෞරව නමස්කාර කිරීමේ හදවතකින් යුක්ත බව පැවසිය හැක. එසේ නම්, එය අමතක වූ අයට ගෞරව නමස්කාර පූර්වක හැඟීම නැවත ලබාගැනීමට උපකාර කරමින්, දෙමාපියන් සහ වැඩිහිටියන් පූජනීය දේවල්වලට ගරු කරමින් නමස්කාර කරන ආකාරය දරුවන්ට දැක ගැනීමට සැලැස්වීම වැදගත්ය. දිනපතා සූත්‍ර සජ්ඣායනා කිරීමත් ඒ සඳහා වැදගත් අවස්ථාවකි.

එයට හේතුව 'මේ මොහොතේ' සිට අනාගත ආරම්භ වන බැවිනි. අපගේ මනස දියුණු කර ගැනීම සහ අපට මේ මොහොතේදී මෙම ස්ථානයේදී කල හැකි දේ උපරිමයෙන් ක්‍රියාවට නැංවිය යුතුය. මන්ද, එයින් ඊළඟ පරම්පරාවට නායකත්වය ලබා දෙන දරුවන්ගේ සහ මුණුපුරු මිණිපිරියන්ගේ හදවත් පෝෂණය වී, සියලු දෙනාටම එකිනෙකාගේ බුද්ධ ස්වභාවය කෙරෙහි විශ්වාසය තැබිය හැකි  අනාගතයක් නිර්මාණය කිරීමසිදු කරන නිසාය. අපගේ දෘෂ්ටිකෝණය වෙනස් කළහොත්, අපට වැඩි වැඩියෙන් වර්ධනය වී දියුණුවීමටත්, අපගේ අනාගතය දීප්තිමත් ගොඩනගා ගැනීමට හැකි වනු ඇත.

කෙසේ වුවද, මුල් ළමාවිය අධ්‍යාපනය සම්බන්ධයෙන් පැවසුවහොත්, දෙමාපියන් දිනපතා දෙවිවරුන්ට සහ බුදුවරුන්ට දෑත් එක්කර වන්දනා කරමින් සාමකාමී සහ සුවපහසු නිවසක් නිර්මාණය කිරීම අන් සියල්ලටම වඩා හොඳ අධ්‍යාපනයක් වේ. විශේෂඥයන් විසින් පූර්ව ප්‍රසව අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව පැවසීමට හේතුව, මවගේ මානසික ස්ථාවරත්වය කලලයට ධනාත්මක බලපෑමක් ඇති කර, දෙමාපියන් සහ දරුවා අතර බැඳීම වැඩි කරන බැවිනි.

මෙහිදී, නිදසුනක් ලෙස නිවසට සැනසීම ගෙන ඒම යන අර්ථයෙන් 'අරිගතෝ (ස්තුතියි)', 'ඉතදකිමස්' ලෙස ආහාරයට ගෞරව කිරීම, 'ගොචිසෝසමා' ලෙසින් ආහාරය පිළියෙල කළ හා එම බෝගයන් වගාවට දයක වු සැමට කෘතවේදී වීම යන වචන තුනෙහි අර්ථය මෙනෙහි කර දිනපතා මුලු හදවතින්ම පැවසීමට පුරුද්දක් කර ගනිමු. එවැනි දෙමාපියන්ගේ සහ වැඩිහිටියන්ගේ ආදර්ශයන් අනාගතය භාරගන්නා දරුවන්ගේ හදවත් ප්‍රබෝධමත් කර පෝෂණය කරනු ඇත.

'කෝසෙයි' පෙබරවාරි කලාපය ඇසුරිණි



Interview

# තමන් සතුටු වීමටනම්, අන් අයගේ සතුට ප්‍රාර්ථනා කර අන්‍යයන් වෙනුවෙන් කැපවෙමු

## ගුන්ජි මිසුම් එරිකා මහත්මිය, බ්‍රසීල ධර්ම ශාඛාව

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූයේ කවදාද, එයට මුල් වූ හේතුව කුමක්ද?**

මීට අවුරුදු 30 කට පමණ පෙර මගේ තාත්තා මාව බ්‍රසීලියානු ධර්ම ශාඛාවට රැගෙන ගිය අතර, එය සාමාජිකත්වය ලබාගැනීමට හේතු වුවා. එකල ධර්ම ශාඛාවේ සමාජ සත්කාරයක් ලෙස ප්‍රදේශයේ ඇදුම සහිත දරුවන්ට ප්‍රතිකාර කරනු ලැබුවා. සාඕ පවුලෝහි වායු දූෂණය නිසා දරුවන් විශාල ප්‍රමාණයක් ඇදුම රෝගයෙන් පීඩා විඳින අතර, වයස අවුරුදු 0 සිට අවුරුදු 13 දක්වා වූ දරුවන්ව මූලික කරගෙන ඔවුන් වෙනුවෙන් කශේරුකා සම්භාහන ප්‍රතිකාර වැඩසටහනක් පැවැත්වූවා. කෝසෙයි කායි සාමාජිකයෙකු නොවුනත් සම්භාහන ප්‍රතිකාර වෛද්‍යවරයෙකුවන මගේ පියා ඔහුගේ කණ්ඩායමේ මිතුරන් සමග වැඩසටහනට ස්වෙච්චාවෙන් සහභාගී වී සිටියා.

එකල මම ඇදහීමට ආගමක් සොයමින් සිටි අතර, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධවීමට ලැබීම සහ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙනීමට හැකිවීමත් බුදුන් වහන්සේගේ මගපෙන්වීම යැයි මම විශ්වාස කරනවා. ඇත්තෙන්ම මම ධර්ම ශාඛාවේ කිසිවෙකුත් නොහඳුන නිසා ධර්ම ශාඛාවට යාමට අදිමදි කලා. කෙසේ වෙතත් වර්තමාන කියෝකයිචෝ වන මරියා හිරොමි සසාකි සාන් තරුණ කණ්ඩායමේ නායිකාව ලෙස මාව සිනහ මුසු මුහුණින් පිළිගෙන උණුසුම් ලෙස මාව පිලිගත්තා. එයට පිං සිදු වන්නට මම තරුණ කණ්ඩායමට එක්ව කටයුතු කරන්න පටන්ගත්තා. වයසින් ගත්කල මගේ වයසට සමාන වුවත් තරුණ කණ්ඩායමේ නායකයෙකු ලෙස මම ගොඩක් ගෞරව කලා.

**තරුණ වියේදී ආගමක් සොයා යාමට හේතුවක් තුබුනාද?**

මට අවුරුද්දක් බාල සහෝදරියක් සිටි අතර ඇය රිය අනතුරකින් මියගියා. මම තරුණ කාලයේදී මෙම සිදු වීම සිදුවුණ අතර මගේ ආදරණීය සහෝදරියගේ අහිමි වීම මගේ තරුණ කාලය පුරා කම්පනයක් ඇතිකල අතර සෑම දිනක්ම වේදනාකාරී දිනයක් වූවා. කුඩා කල නංගීත් සමග සෙල්ලම් කරමින් ගතකල හැටි සිහියට එන විට කඳුලු වැටෙනා තරම් දුකක් ඇතිවුනා. එනිසා මට ආධ්‍යාත්මිකව ශක්තිමත් වීමට මාර්ගයක් දහමක් ලෙස රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානය හමු වු අතර, ආදි මුතුන් මිත්තන් වෙනුවෙන් පිංපෙත් පැමිණවීමේ වැදගත්කම ඉගෙනීමට ලැබීම ගැන සහ දිනපතා උදේ සවස සූත්‍ර සජ්ජායනය කිරීමට හැකිවීම ගැන මම ස්තුතිවන්ත වනවා. මුලදී මට සූත්‍ර පොතේ තිබෙන දේ ගැන නොතේරුණු නමුත්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ආනිසංස ඔයාගේ නමින් මියගිය ආදි මුතුන් මිත්තන්ට ඒවගේම හදිසි අනතුරින් මිය ගිය ඔයාගේ සහෝදරියටත් ලැබෙන බව වැඩිහිටියෙකුගෙන් ඉගෙන ගන්න ලැබුණු අතර මම කැපවීමෙන් සූත්‍ර සජ්ජායනය කිරීමට පෙළඹුනා. පසුව ඔහුගෙන් බොහො කරුණු කාරණා ඉගෙන ගත්තා. ඒ අනුව මම දිනපතා සූත්‍ර සජ්ජායන කරන විට මගේ හිත සන්සුන් වූ අතර දුක්වේදනාවන් අඩුවී අවුරුදු ගණනක කම්පනයෙන් මිදෙන්න හැකි වුනා.

**2024 අවුරුද්දේ 10 වෙනි මාසයේදී ඔබ ධර්මාචාර්යය ලබාගැනීමෙන් පසු ඔබගේ වර්තමාන හදවතේ හැඟීම මොන වගේද?**

මේ වන තෙක් මම මගේ ප්‍රශ්න විසඳගැනීම වෙනුවෙන් මම සද්ධර්මය ඉගෙන ගත්තා යැයි මම සිතනවා. කෙසේ වෙතත්, ධර්මාචාර්යය ලැබීමත් සමග මම මගේ හදවත සංවර්ධයන කර ගැනීමට අරමුණු කරන අතර, තවත් පියවරක් ඉදිරියට තබමින් අන් අයගේ සතුට ප්‍රාර්ථනා කරමින් අන් අයට ධර්මය කියාදීමටත්, මම ධර්මය ඉගෙනීමෙන් ලද සතුට අන් අයටත් භුක්ති විඳීමට ඉඩ සලසා දීමට හැකිතාක් පිරිසක් සතුටට පත් කිරීමට සිතනවා. මෙම හැඟීම වචනයට පමණක් සීමා නොකර, අන් අයට ආදර්ශයක් වන ලෙස ජීවත් වනවා




ගිය අවුරුද්දේ දෙසැම්බර් මස 08 වෙනි දින බුද්ධත්වය සැමරු උත්සවයේදී සෙප්පෝව ඉදිරිපත් කරන ගුන්ජි මහත්මිය

යනුවෙන්, කෘතවේදී හදවතින් යුතුව ධර්මාචාර්ය ලබාගත් දින දයිසේදෝවේදී බුදුන් වහන්සේ ඉදිරියේ පොරොන්දු වූවා.

**සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි ඔබ කැමතිම ධර්ම කරුණ කුමක්ද ?**

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ පස්වන පරිච්ඡේදයේ ඖෂධ පැලෑටි උපමාව මා සිත්ගත් පරිච්ඡේදයක් වනවා. එහි මේ ලෝකයේ විවිධ ප්‍රමාණයේ තණකොළ ගස්වැල් පෙනුමෙන් අසමාන ලෙස පෙනුනත්, සියලුම ශාක සමානව වර්ෂාව ලබාගෙන එකිනෙකාට අනුකූල ලෙස වර්ධනය වීම සමාන බව උගන්වනවා. හැඩය, ස්වභාවය සහ ප්‍රමාණය ආදී වශයෙන් ගත් කල මතුපිටින් වෙනස්කම් තිබුණද, උස්මිටි කමක් නොමැතිව සියල්ලෝම වටිනා ජීවීන් බව උපමාවකින් උගන්වනවා. ඒ අනුව අප වටා විවිධ පෞරුෂයන්ගෙන් යුත් මිනිසුන් සිටියත් කිසිවෙකුවත් නොවටිනා පුද්ගලයින් නොවේ සියලුම දෙනා බුද්ධ ස්භාවයක් තිබෙන වැදගත් පුද්ගලයින් බව උගන්වන කාරණය මගේ හදවතට හොඳින්ම දැණුනා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි ඉගැන්වීම් තුලින් අගය කොට සලකන කාරණය කුමක්ද?**

රිෂ්ෂෝ කෝසෙයි කායිහිදී නිතරම 'තමන් වෙනස් වුවහොත් අන් අයද වෙනස් වනවා' යනුවෙන් උගන්වයි. පොදුවේ ගත් විට මිනිසුන් නිරන්තරයෙන් අන් අයව වෙනස් කිරීමට උත්සහ කරනවා. නමුත් යථාර්ථය නම්, තමන්ට අන් අයව වෙනස් කල නොහැකි. මම මගේ නැනා සමග සිදු වූ ගැටුමක් හේතුවෙන් මම ඇයව වෙනස් කිරීමට බොහෝ උත්සහ කල අතර එය වේදනාකාරී සිදුවීමක් වූවා. කෙසේ වෙතත් කෝසෙයි කායිහිදී 'මුලින් තමන් වෙනස් වන්න' යනුවෙන් ඉගෙන ගත් අතර



ගිය අවුරුද්දේ මාර්තු මස 10 වන දින 86 වන සංවත්සර සැමරුම් උත්සවයේ පරිවර්ථනයෙන් සහාය වන ගුන්ජි මහත්මිය (වම් පස)



ස්වාමියාත් දියණියන් දෙදෙනාත් සහ ඔවුන්ගේ ආදරණීය සුරතලා සමග

මම එය ක්‍රියාවට නැංවීමෙන් පසු නැනා සමග මගේ සම්බන්ධය සමතයකට පත් වූ අතර, දැන් අප දෙදෙනා සම්පව කටයුතු කරනවා සහ මෙම ඉගැන්වීමට මම හදවතින්ම කෘතඥ වනවා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ආකර්ෂණීයම කරුණ කුමක්ද?**

ඉතාමත් ආකර්ෂණීයම කරුණනම්, 'අන් අය ප්‍රථමයෙන්' යන හදවතින් බෝධිසත්ව චර්යාව පුහුණු කිරීමයි. මෙතෙක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ ඉගැන්වීම් තුලින්, ඇතෙන්ම සතුටින් සිටීමටනම්, අන් අයගේ සතුට ප්‍රර්ථනා කිරීම සහ අන් අය වෙනුවෙන් කැපවී කටයුතු කිරීම වැදගත් කියා ඉගෙන ගත්තා. ඉගැන්වීම් වලට අනුව තමන් විසින්ම බෝධිසත්ව චර්යාව ප්‍රගුණ කිරීම අන් අයගේ සතුට පිණිසම සිතා කටයුතු කරන්නෙ නම් තමාද වර්ධනය වන අතර එය අන් අයටද ප්‍රයෝජනවත් වේ. 'අන් අය ප්‍රථමයෙන්' යන්න මම දකින්නේ එලෙසින්.

**අවසාන වශයෙන් මේ මොහොතේ ඔබගේ බලාපොරොත්තුව සහ අනාගත අරමුණ කුමක්ද?**

මේ වසර තුල, බ්‍රසීල ධර්ම ශාඛාවේ සාමාජිකයින් බලාපොරොත්තුවෙන් සිටි 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ' පෘතුග්‍රීසී පරිවර්තනය ප්‍රකාශයට පත් කිරීමට සූදනම්. මෙම විශේෂ වූ වසරේ මම තවමත් දුර්වල වුවත් ධර්ම මිතුරන් සමග එක්ව කටයුතු කිරීමට සිතනවා. කියෝකයිචෝ සසකී සාන්ට හැකි අයුරින් දයකත්වය ලබාදීමට මහන්සි වී කටයුතු කරන්න මම කැමතී. දැනට ධර්ම නායකයෙකු ලෙස කටයුතු කරන අතර, සාමාජිකයින් සමග ප්‍රදේශයේ ධර්ම ව්‍යාප්ත කටයුතු කිරීමට අදහස් කරනවා. ඒ වගේම ධර්ම ශාඛාවේ වැඩසටහන් වලදී නිර්මාතෘ තුමාගේ සහ නිචිකෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් පෘතුග්‍රීසී භාෂාවට පරිවර්ථනය කිරීමේ රාජකාරිය තුලින් හැකිතාක් පිරිසකට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීන් ඉගැන්වීමට මම මගේ උපරිමය කරමි.

# නිර්මාතෘ තුමාගේ උපන්දින සැමරුම් උත්සවය

නොවැම්බර් 15 යනු නිර්මාතෘ තුමාගේ උපන්දින සැමරුම් උත්සව දිනයයි.

නිර්මාතෘ තුමා 1906 අවුරුද්දේ නොවැම්බර් 15 වන දින නීගතා ප්‍රාන්තයේ තෝකමචි නගරයේ සුගනුමා නම් ගම්මානයේ මෙලොව එලිය දුටුවා. තෝකියෝවට ගිය පසු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හා හමු වූ අතර, මිනිසුන් දුකින් මුදවා ගැනීමට, මේ ලෝකය නැවත් ගොඩ නැගීමට සිතා සද්ධර්ම පුණ්ඩරීක සූතය පදනම් කොට ගෙන රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය ආරම්භ කලා.

නිර්මාතෘ තුමාට පිං සිදු වන්නට අපට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හමුවී තිබෙන අතර ප්‍රීතිමත් මාවතක ගමන් කිරීමට හැකිව තිබෙනවා.

උපන්දින සැමරුම් උත්සවයේදී නිර්මාතෘ තුමාගේ කාරුණික හදවත ගැන පසුවිපරම් කර, කෘතවේදීත්වය පලකරමින් සූත්‍ර සජ්ජායනය කරනවා.








**දැනුමට යමක්**

'බුදු දහමේ 'මෘදු සිනහමුසු මුහුණ ආදරණීය භාෂාවක් ' ලෙස සදහන් වනවා. මෘදු සිනහවෙන් ආදරණීය වචන භාවිතා කරමු යන්න මෙහි තේරුමයි. දීප්තිමත් සිනහවකින් සහ උණුසුම් වචන වලින් මිනිසුන්ගේ හිත් සහ සමාජය ආලෝකමත් කල නිර්මාතෘ තුමා මෘදු සිනහවක් ආදරණීය භාෂාවක් ඇති නිහතමානී පුද්ගලයෙකු වූවා.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## අනුස්මරණ සැමරුම් උත්සව (ගොමෙයිනිචි)






ගොමෙනිචි යනු මාස භාගයකට සැරයක් (සෑම මාසයකම 1 වන සහ 15 වන දින) එදිනෙද ධර්ම පුහුණුවේ ප්‍රගතිය ගැන මෙනෙහි කිරීමට සහ ධර්ම මිතුරන් සමග තම සතුට බෙදා ගැනීමට සහ ධර්ම ව්‍යාප්තිය වෙනුවෙන් අධිෂ්ඨානයන් අලුත් කරනා දිනයන් වේ.

ගොමෙනිචි, බුදුන් වහන්සේගේ ධර්මය ඉගෙනීමට ලැබීම ගැන කෘතවේදී වීමටත්, අන් අයට ධර්මය ඉගැන්වීමටත් අධිෂ්ඨානයන් අලුත් කිරීමට දිනයක් වේ. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ගොමෙනිචි දිනයන් පහත පරිදි වේ.

මාසයේ පළමු දින ධර්ම ශාඛාව වන්දනාමාන කිරීම සහ නිචිකෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවිඩයට සවන්දීම සහ එම මාසය තුල ආධ්‍යාත්මික ජීවිතයට මාර්ගෝපදේශයක් ගැනිම සහ නව අරමුණන් ඇතිකර ගැනීම.

4 වන දින නිර්මාතෘ අනුස්මරණ දිනය, නිර්මාතෘ තුමා සිහිකර ගෞරව දැක්වීම කෘතවේදීත්වය පළකිරීම සහ නව අරමුණු ඇතිකර ගැනීම.

10 වන දින මකිසො සමා අනුස්මරණ දිනය, මකිසො සමාගේ දයාවේ හදවා ආදර්ශයට ගෙන ජීවත් වීමට අධිෂ්ඨාන කිරීම.

15 වන දින ශාක්‍යමුණි බුදුන් වහන්සේගේ අනුස්මරණ දිනය, අපට දුකින් මිදීමේ මාර්ගය පෙන්වා දුන් බුදුන් වහන්සේට කෘතවේදීත්වය පුද කරන දිනයක් ඊට අමතරව 1 වන දින ඇතිකරගත් අරමුණ වෙනුවෙන් අපගේ ධර්ම පුහුණුව ගැන පසු විපරම් කිරීම සහ ඉතිරි අර්ධය වෙනුවෙන් අධිෂ්ඨාන කිරීම.

**දැනුමට යමක්**

ගොමෙනිචි යනු යම් පුද්ගලයෙකු මිය ගිය දිනයයි. එදිනට මිය ගිය පුද්ගලයා කැමති දෙයක් බුදුන් වහන්සේට පූජාකර හදවතින් සූත්‍ර සජ්ජායනය කරනවා. රිෂ්ෂෝ කෝසෙයි කායිහිදී බුදු පිළිම වහන්සේ වැඩමවූ දිනයත් ගොමෙනිචි ලෙස හඳුන්වනු ලබයි.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# මුළු ලෝකයම ධර්මය අදහන පිරිසක් බවට පත්කරමු

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අදහන පිරිස ප්‍රභූතරත්න බෝධිසත්වයන් වේ

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



එම නිසා, ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම තුලින් ලබාගත් ආනිශංස තම අවට සිටින පිරිසට පවසන අය, ප්‍රභූතරත්න තථාගතයන්' සේ හැඳින්විය හැකිය.

නිච්රෙන් ෂෝනින් තුමාව සදෝ දූපතෙන් පලවා හැරී අවස්ථාවේදී, එහි සිටි ශ්‍රද්ධා භක්තිකයෙක් වන අබුත්සුබෝ විසින් නිච්රෙන් තුමාව ඝාතනය කිරීමට සිතුවේ, එතුමා අමිත බුදුන්ගේ ද්‍රෝහියෙකු යැයි සිතාය. නමුත්, නිච්රෙන් තුමාගේ ගතිගුණ හා ආකල්ප දැක තම සිතුවිලි වෙනස්කරගනිමින් ඔහු හා භාර්යාව ගෝලයන් බවට පත්විය.

එම අබුත්සුබෝ විසින්, 'ප්‍රභූතරත්න තථාගත ස්තූපයේ අරුථ කුමක්දැයි' ලිපියකින් විමසූ අවස්ථාවේ, නිච්රෙන් තුමා එයට පිලිතුරු ලබාදුන්නේ මෙසේය.

'ධර්මය නොමැති කාල වකවානුව වනවිට, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සරණ ගිය පිරිසට වඩා, නොයෙකුත් ස්ථූප වලින් සැම තැනම පිරී යයි. එම නිසා නමුමියෝ හෝරෙන්ගේ ක්යෝ සජ්ඣායනා

කරන්නාවූ එම සුළු පිරිස, තම ශරිරය ප්‍රභූතරත්න ස්තූපය කරගෙන, එමන්ම තමන් ප්‍රභූතරත්න තථාගතයන් බවට පත්විය යුතුය. ඒ වෙනුවෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හැර වෙන සරණක් නොමැත. එබැවින්, අබුත්සුබෝ ප්‍රභූතරත්න තථාගත ස්තූපය වී, ප්‍රභූතරත්න තථාගත ස්තූපය අබුත්සුබෝ වන්න ඒ හැර වෙනත් දක්ෂතා හෝ ලාභයන්ගෙන් එලක් නොවේ'


මෙහි සදහන් 'ඒ හැර වෙනත් දක්ෂතා හෝ ලාභයන්ගෙන් එලක් නොවේ' යන වැකිය තුල, ගැඹුරු අරුතක් තිබේ. එනම් කොතරම දැනුමෙන් විශිෂ්ඨයෙකු වූවත්, එයට වඩා වැදගත් වන්නේ හදවතින් ශ්‍රද්ධාවන්ත වීමයි.

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ සාමාජිකයන්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හා බැදී සිටින පිරිසක් නිසා, උදෑසන හා සවස 'නමුමියෝ හෝරෙන්ගේ ක්යෝ' ලෙසින් සජ්ඣායනා කරයි. එම ඔවුන් සියළුමදෙනා 'ප්‍රභූතරත්න තථාගතයන්' වේ,. බුදුන් වහන්සේ හා සමඟ ප්‍රභූතරත්න ස්ථූපයේ එක පෙළට ආසන ගැනීමට හැකි පුද්ගලයන්ය. එම හැඟීම සිතට බද්ධ කරගන්න. එය පුහු මාන්නයක්ද නොවේ, ආත්ම විශ්වාසය වේ.

'දිළිඳු පුත්‍රයාගේ උපමා කථාවේ' ඔහුට තමන් දිළින්දෙකු නොවන බව වටහා ගැනීමට අවුරුදු 20ක් ගතවුවේ, කලින් සදහන් කළ ආකාරයේ හැඟීමක් හෙවත් ආත්ම විශ්වාසයක් නොතිබුණු නිසාවෙනි. සිටුවරයාට(බුදුන් වහන්සේට) කිළිටි ඇදුම් පැලදුම් පවා ඇදීමට සිදුවිය. එසේ කරමින් පවා දිළිඳු පුත්‍රයාට සමීප වී, 'අපි තාත්තයි පුතයි වගේ' යැයිද පැවසිය. එසේ වූවත් දිළිඳු පුත්‍රයා තමන් 'වැඩකට නැති මෝඩ කෙනෙක්' සේ සිතුවා.

ඔයාලත් සමහර විට මම 'දිළිඳු පුත්‍රයෙක්' යැයි සිතා සිටින අවස්ථාවන් තිබෙන්නට ඇති. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දැන හඳුනනවා යනු, කෙසේවත් 'දිළිඳු පුත්‍රයෙක්' නොවේ. බුද්ධ පුත්‍රයෙක් වනවා සේම, ධර්මය නොකඩවා පවත්වා ගැනීමට දයක වන්නෙකි. එම සත්‍ය වූ කරුණ නැවත වතාවක් ආවර්ජනය කර ගන්න. මන්ද ඊටඑහා ගිය වෙනත් දක්ෂතාවයක් හෝ ලාභයක් නොමැති නිසාය.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 67-68 පිටු ඇසුරිණි



# Director’s Column

## වසන්තයේ මුල හැගෙනා සිතුවිලි

කෙයිඉචි අකගාවා මහතා
රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානය

සුභ දවසක් වේවා සැමදෙනාටම. ජනවාරි මස 20 වන දින ආරම්භ වූ ‘අධික ශීත ඍතුවේ උදෑසන සූත්‍ර සජ්ඣායනය’ අවසන්ව වී, පෙබරවාරි මස 3 වන දින සිට කැලන්ඩරයට අනුව නව වසන්තය උදාවෙනවා. ටෝකියෝව නම් තවමත් සීතල දිනයි ගෙවෙන්නේ. නමුත් දුර පළාත් වලින් නම් වසන්තය උදාවීම සනිටුහන් කරන උමේ මල් පිපිමට පටන්ගෙන ඇතිබවට ආරංචි ලැබෙනවා. දිනපතා රාජකාරියට පැමිණෙන වෙලාවට පෙනෙන නොයෙකුත් දර්ශනයන් හා සුළඟේ හඬ තුලින් ඍතුවේ වෙනස්වීම් ඉතා සියුම්ව දැනෙනවා සේම, සීත ඍතුවේ නිදසිටි පරිසරයද කෙමෙන් කෙමෙන් අවධිවන  ස්වරූපය දකින් විට ඉතාමත් සතුටුයි. වසන්තය ළඟටම පැමිණ තිබෙනවා.

තවද, පෙබරවාරි මාසය ජපානයේ අපිට ඉතාමත් වැදගත් මාසයක්, ඒ බුදුන් වහන්සේගේ ‘පරිණිර්වානය’ සමරණ නිසායි. රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ දයිසෙයිදෝවේදීද එය උත්කර්ෂවත් ලෙස සමරණවා. බුදුන් වහන්සේගේ පරිණිර්වාණයේ අරුත හොඳින් ගිහි බෞද්ධයන් වන අපි ග්‍රහණය කරගෙන, එදිනෙදා ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට අධිෂ්ඨාන කරගනිමු.


මේ මස නිචිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩය තුල, ‘අපි වැඩි වැඩිය දියුණුවටත් වර්ධනයටත් පත්වනවිට, ඒ තුලින් යහපත් අනාගතයක් උදාකර ගැනීමට හැකිවෙනවා’ ලෙසින් කියා දුන්නා. ඒ වෙනුවෙන්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය වඩා හොඳින් භාවිතයට ගන්නේ කෙසේ ලෙසින් සිතා, ධර්මයට අනුකූලව සතුට උදාකර ගැනීමට, එදිනෙදා ජීවිතය තුල ධර්මය සිතින්, කයෙන් හා වචනයෙන් මුමුණමින්, පසුගිය වසරේ තිබුණ තමාගේ අයහපත් සිතුවිලි, සර්පයෙකු හැව අරිනවා මෙන් ගසා දමා අළුත් වූ පුද්ගලයෙකු බවට පත්වෙමු.



ඇමෙරිකාවේ ශාන්ත අන්තෝනියෝ ප්‍රදේශයේ ධර්ම ශාඛාව විවෘත කිරීමේ උත්සවයේ,
මල් පූජාවට සහභාගී වූ පිරිස සමඟ
2024 දෙසැම්බර් මස 8 වනදින




## A Global Buddhist Movement




**Information about local Dharma centers**

**facebook**

**X**

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp